# 16 දරු ප්‍රසූතිය සිදුකළ මවක් ,දරුවෙක් ගැබ්ගත් මවක්, කළයුතු දෑ



දරුවෙක් ගැබ්ගත් පසු, දරුවෙක් බිහිකළ මවක් නගරසභාවේදීහෝ, රෝහලේදී පහත සඳහන් දෑ සිදුකළ යුතුයි.කරුණාකර ඔබගේත් දරුවාගේත් සෞඛ්‍ය තත්වය වඩා වැදගත්බව කල්පනා කරන්න.
නගරසභාවේ <සෞඛ්‍ය සේවා උපකාරක අංශය ( *Kenkō Shienka* ) > වෙත පැමිණ ඔබට අවශ්‍ය ඕනෑම උපදෙසක් ලබාගත හැක.





















● ඔබට දරුවෙක් පිළිසිඳ ගත්විට පහත සදහන් අනුපිළිවෙලට ඒ ඒ අංශ වලින් උපදෙස් ලබාගන්න.

| කවදාද? | යායුතු ස්ථානය? | කුමක් කළයුතුද? | |
|---|---|---|---|
| ඔබ ගැබ්ගත් විට<br>( ඔබට දරුවෙක් පිළිසිඳ ගත්විට )<br> | රෝහල | • දරුවෙක් පිළිසිඳ ගත්විට ප්‍රසව සහ නාරි වෛද්‍ය අංශය ( *Sanfujinka* ) ඇති රෝහලකට ගොස් මවගේ සෞඛ්‍ය තත්වය පරීක්ෂා කර ගත යුතුයි.<br>  | |
| | නගරසභාවේ සෞඛ්‍ය සේවා උපකාරක අංශය අංශය<br>( *Kenkō Shienka* ) | • රෝහලෙන් පරික්ෂා කරගත් පසු නගරසභාවේ <සෞඛ්‍ය සේවා උපකාරක අංශය > ( Kenkō Shienka )වෙත ගොස් විස්තර පත්‍රය පුරවා **ගර්භනී භාවය පිළිබඳව දැනුම්දීම 「 *Ninshin todoke* 」** කළයුතුයි.<br>• මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොත 「***Boshi Kenkō Techō*** 」 (ගර්බහනී කාළයේ සිට මව සහ දරුවාගේ සෞඛ්‍ය තත්වයන් සටහන් කරන අත්පොත) ලබාගත යුතුයි.<br>• සන්මු නගරයේ **ලියාපදිංචිවී සිටින අය ( *Jūsho ga aruhito* ), ගර්භණී සහ ළදරු සායන සෞඛ්‍ය පිරික්සුම් ඉල්ලුම්පත 「 *Ninpu・Nyūji Ippan Kenkō Shinsa Jushinhyō* 」** ලබාගන්න.<br>  | ✎ P.61 ~ P.62 |
| ඔබ ගැබ්ගත් පසු<br>( දරු ප්‍රසූතියෙන් පසු ඉක්මනින්ම )<br> | නගරසභාවේ සෞඛ්‍ය සේවා උපකාරක අංශය<br>( *Kenkō Shienka* ) | • බිළිදා හමුවීමේ සම්හන්ධතා පෝරමය ,(**අළුත උපන් බිළිදාගේ සෞඛ්‍ය තත්වය සොයා බැලීමට වින්නබු මාතාව නිවසට පැමිණීම සදහා ඉල්ලුම් කිරීමේ පෝරමය ) 「 *Akachan Hōmon Renrakuhyō*** උප්පැන්න දැනුම්දීම(**දරුවා ඉපදුන බව සදහන් කරන ලියවිල්ල ) ( *Shusshō Tsūchisho* ) 」** ඉදිරිපත් කිරීම. | |
| | නගරසභාවේ ජාතික සෞඛ්‍ය රක්‍ෂණ සහ පැන්ෂන් අංශය<br>( *Kokuho Nenkina* ) | • සමාජ සෞඛ්‍ය රක්‍ෂණය ( *Shakaihoken* ) ට ඇතුල්වී සිටින පුද්ගලයෝ සමාගමේ සෞඛ්‍ය රක්‍ෂණ කටයුතු සම්හන්ධව ක්‍රියාකරන පුද්ගලයින්ගෙන් උපදෙස් ලබාගන්න.<br>• දරුවාව ජාතික සෞඛ්‍ය රක්‍ෂණ 「***KokuminKenkōhoken*** 」 ට ලියාපදිංචි කරන්න. | ✎ P.63 |
| දරුවා ඉපදී දින 14ක් ඇතුළත නගරසභාවේ ලියාපදිංචි කලයුතුයි | නගරසභාවේ මහජන සම්හන්ධතා අංශය<br>( *Shiminka* ) | • <u>උප්පැන්න ලියාපදිංචිය</u>**(දරුවා ඉපදුන බව නගර සභාවට දැනුම් දීම) 「 *Shusshōtodoke* 」** කරුණාකර රෝහලෙන් ලබාදෙන දරුවාගේ උපන් සහතිකය රැගෙනගොස් නගරසභාවට ඉදිරිපත් කරන්න. | |

| කවදාද? | යායුතු ස්ථානය? | කුමක් කළයුතුද? | |
|---|---|---|---|
| ඉපදුන දිනට පසු දිනයේ සිට 15වෙනිදා දක්වා | නගරසභාවේ ළමා ආරක්ෂණ ආධාරක අංශය (*Kosodate Shienka*) | • ළමා දීමනාව(දරුවා හදාවඩා ගැනීම සඳහා ලැබෙන සහනාධාර මුදල් ) 「***Jidō Teate***」 ඉල්ලුම් කරන්න. | P.69 ~ P.70 |
| දරුවා ඉපදුන දින සිට දින මාසයක් ඇතුළත | | • දරුවාව සෞඛ්‍ය රක්ෂණයකට ඇතුල් කලපසුව ළමා වෛද්‍ය සහනාධාර (වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා නගරසභාවෙන් ලබාදෙන සහනදායි සේවාව) 「***Kodomo Iryōhi Josei***」 ඉල්ලුම් කරන්න. | |
| දරුවා ඉපදී දින 60ක් පසුවූවාට පසුව | රෝහලේදී | • කරුණාකර දරුවාට නියම කර ඇති එන්නත් 「***Yobō Sesshu***」 ලබාගන්න.<br>• එන්නත විදීමට පෙර නගරසභාවේ සෞඛ්‍ය සේවා උපකාරක අංශය ( *Kenkō Shienka* ) වෙත ගොස් කරුණාකර උපදෙස් ලබාගන්න.  | P.66 ~ P.67 |
| දරුවා ඉපදී දින 90ක් පසුවූවාට පසුව | නගරසභාවේසෞඛ්‍ය සේවා උපකාරක මධ්‍යස්ථානය ( *Hoken Sentā* ) | • ළදරු වෛද්‍ය පරීක්ෂණය (අළුත උපන් බිළිඳාගේ ශරීර සෞඛ්‍ය පරීක්ෂණය 「***Nyūyōji Kenkō Shinsa***」 සඳහා කරුණාකර දරුවා රැගෙන එන්න.<br>• සෞඛ්‍ය සේවා උපකාරක අංශය( Kenkō Shienka ) වෙත ගොස් උපදෙස් ලබාගන්න.  | P.65 ~ P.66 |

## ගර්භණී අවස්ථාවේදී ( ඔබට දරුවෙක් පිළිසිඳගත්විට )කුමක් කළයුතුද?



### (1) කරුණාකර රෝහලට යන්න

ගැබ්ගත් විට රෝහලට ගොස් වෛද්‍ය වරයා ලවා පරීකෂා කර ගන්න.
දරුවාව ඉපදීමෙන් පසුව රෝහලේදී වෛද්‍ය වරයා ලවා පරීකෂා කරවා ගන්න.

### (2) කරුණාකර නගරසභාවේ < සෞඛ්‍ය සේවා උපකාරක අංශය ( *Kenkō Shienka* ) > වෙත පැමිණෙන්න

රෝහලට ගියාට පසුව නගරසභාවේ < සෞඛ්‍ය සේවා උපකාරක අංශය ( *Kenkō Shienka* ) > වෙත පැමිණ, පහත සඳහන් ආකාරයට කටයුතු කරන්න.

① ගර්භනී භාවය පිළිබඳව දැනුම්දීම 「***Ninshintodoke***」 සඳහාවූ විස්තර පත්‍රය පුරවා බාරදෙන්න.

② මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොත 「***Boshi Kenkō Techō***」(ගර්බනී කාළයේ සිට මවගේ සහ දරුවාගේ සෞඛ්‍ය තත්වයන් සඳහන් කරන අත්පොත) සහ බිළිඳා හමුවීම සම්බන්ධතා පෝරමය 「***Akachan Hōmon Renrakuhyō***」 (අළුත උපන් බිළිඳාගේ සෞඛ්‍ය තත්වය සොයාබැලීමසඳහා වින්නබු මාතාවට නිවසට පැමිණීම සඳහා ඉල්ලුම් කිරීමේ පත්‍රිකාව, දරුවාඉපදුන බව සඳහන් කරන ලියවිල්ල 「***Shusshō Tsūchisho***」 ලබාගන්න.

③ නගරසභාවේ ලියාපදිංචි වී සිටින අය ( *Jūsho ga aruhito* ) ගර්භණී සහ ළදරු සායන සෞඛ්‍ය පිරික්සුම් ඉල්ලුම්පත 「 *Nimpu・Nyūji Ippan Kenkō Shinsa Jushinhyō* 」 (අ ලුත උපන් බිළිදාගේ ශ්‍රවණ පරීක්ෂණ උපදේශණ පෝරමය 「 *Shinseiji Chōkaku Kensa Jushinhyō* , දරු ප්‍රසූතියෙන් පසුව වෛද්‍ය පරීක්ෂණ උපදේශන පත්‍රිකාව 「*Sampu Kenkō Shinsa Jushinhyō* 」 කරුණාකර මෙම ලියකියවිලි ලබාගන්න.




● මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොත (ගර්බහනී කාළයේ සිට මවගේ සහ දරුවාගේ සෞඛ්‍ය තත්වයන් සදහන් කරන අත්පොත ( *Boshi Kenkō Techō* )

ගර්භණී අවස්ථාවේ සිට දරුවා ලොකුවන තෙක් භාවිතා කරන, බෙමෙම අත්පොත බොහෝසෙයින් අත්‍යවශ්‍ය දෙයකි.රෝහලට යනවිට මෙම පොත රැගෙන යන්න.

<නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ>

① ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත ( *Zairyū Kādo* ) හෝ ස්ථිර පදිංචි කරුවන් සදහා නිකුත් කර ඇති සහතිකය ( *Tokubetsu Eijūsha Shōmeisho* )

② සෞඛ්‍ය රක්‍ෂණ පත ( ජාතික සෞඛ්‍ය රක්‍ෂණ කාඩ්පත ( *Kokumin Kenkōhokenshō* ) හෝ සමාජ සෞඛ්‍ය රක්‍ෂණය ( *Shakaihokenshō* ) )

③ විදේශ ගමන් බලපත්‍රය ( පාස්පෝට් එක )

උපදෙස් ලබාගන්නා ස්ථානය

● හපිනෙසු ● ( *Hapinesu* )

【 ගර්භ නීමව්වරුන් සහ ළදරුවන් සදාහා උපකාරක මද්‍යස්ථානය 】

( *Kosodate Sedai Hōkatsu Shien Sentā* )

දුරකථනඅංකය **0475-80-1381**



◎ 60 පිටුවේ සහ 62 වෙනිපිටුවේඅමාරු වචන ◎

※ප්‍රසව සහ නාරි වෛදි අංශය ( Sanfujinka ) : දරුවෙක් පිළිසිඳගත් පසු බිළිදාගේ සෞඛ්‍ය තත්වය සොයා බැලීමට හැකි රෝහල දරු ප්‍රසූතියක් කළහැකි ස්ථානය

※ ගර්භනී භාවය පිළිබඳව දැනුම්දීම ( Ninshintodoke ): රෝහලේදී තමන් ගැබ් ගෙන ඇතිබව දැනගත් පසු, දරුවෙක් පිලිසිදගෙන ඇති බව වෛද්‍යවරයා විසින් සනාථ කළවිට , එම වෛද්‍ය සහතිකය ඔබ ලියාපදිංචි වී සිටින නගරසභාවට ඉදිරිපත් කරන්න.

※ මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොත ( Boshi Kenkō Techō ): (ගර්බහනී කාළයේ සිට මව සහ දරුවාගේ සෞඛ්‍ය තත්වයන් සදහන් කරන අත්පොත). ගර්භනී භාවය පිළිබඳව දැනුම්දීම දරු උප්පත්තියේ සිට දරුවා ලොකුවන තෙක් ඒ ඒ වයස් මට්ටම් වලදී දරුවාගේ සෞඛ්‍ය තත්වයන් පිළිබදව සටහන් කිරීම සදහාත්, දරුවාගේ සායන වළට යැමේදීත් මෙම සටහන් පොත අත්‍යවශ්‍ය වේ.

※ගර්භණී සහ ළදරු සායන සෞඛ්‍ය පිරික්සුම් ඉල්ලුම්පත (Nimpu・Nyūji Ippan Kenkō Shinsa Jushinhyō , , අලුත උපන් බිළිදාගේ ශ්‍රවණ පරීක්ෂණ උපදේශණ පෝරමය (Shinseiji Chōkaku Kensa දරු ප්‍රසූතියෙන් පසුව වෛද්‍ය පරීක්ෂණ උපදේශන පත්‍රිකාව Sampu Kenkō Shinsa Jushinhyō ) : දරු ප්‍රසූතියෙන් රෝහලය යනවිට රැගෙන යන සායන ඉල්ලුම් පත්.මෙම කූපන් පත පරිහරණයකිරීමෙන් රෝහලේ දී ගෙවියයුතු මුදල්වල අඩුවීමක් සිදුවේ.

◎ 60 පිටුවේ සහ 62 වෙනිපිටුවේඅමාරු වචන ◎

※මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොත අළුත උපන් බිළිදාගේ සෞඛ්‍ය තත්වය සොයාබැලීමසඳහා වින්නබු මාතාවට නිවසට පැමිණීම සඳහා ඉල්ලුම් කිරීමේ ලිපිය

( දරුවාඉපදුන බව සඳහන් කරන ලියවිල්ල ) ( Akachan Hōmon Renrakuhyō ) :

නගරස මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොත අළුසෞඛ්‍ය තත්වයන් සටහන් කරන අත්පොත ( Boshi Kenkō Techō ) සමග ලබාදෙන පෝස්කාඩ්පත

※ උප්පැන්න ලියාපදිංචිය(දරුවා ඉපදුන බව නගර සභාවට දැනුම් දීම) ( Shusshōtodoke ) : දරුවෙක් ඉපදුන විට තමා පදිංචි නගරසභසභාවට දැනුම් දීමේ ලියවිල්ල

※ළමා දීමනාව (දරුවා හදාවඩා ගැනීම සඳහා ලැබෙන සහනාධාර මුදල් ( Jidō Teate ) : දරුවෙක් ඉපදී අවුරුදු15ක් ගතවනතෙක් දරුවාගේ වර්ධනයටඋපකාරී කර ගැනීම සඳහා නගරසභාවෙන් ලබාදෙන ආධාර මුදල් ( 68වෙනි පිටුව කියවන්න. )

※ළමා වෛද්‍ය සහනාධාර (Kodomo Iryōhi Josei ) : (වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා නගරසභාවෙන් ලබාදෙන සහනදායි සේවාව)දරුවාට අවුරුදු 15 දක්වා රෝහලට යනවිට නොමිළේ වෛද්‍ය සේවය ලබාගතහැක.මුදල් අයකිරීමක් සිදු නොවේ. ( 68පිටුවේ සිට 69වෙනි පිටුව දක්වා කියවන්න. )

※එන්නත්( Yobō Sesshū ) : දරුවෙක් ලෙඩරෝග වැළදීමෙන් වළක්වා ගැනීම සඳහා භාවිතා කරනු ලබන එන්නත් ව ර්ගවේ.එන්නත් ලබාදීම ජපානයේනීතියක් ලෙසනිරණය කරඇත.

※ළදරු වෛද්‍ය පරීක්ෂණය ( Nyūyōji Kenkō Shinsa ) : (අළුත උපන් බිළිදාගේ ශරීර සෞඛ්‍ය පරීක්ෂණය ) රෝහලේදී හෝ සෞඛ්‍ය මධ්‍යස්ථානය බිළිදාගේ සෞඛ්‍ය තත්වය පරික්ෂා කර බැලීම.

※සෞඛ්‍ය මධ්‍යස්ථානය(Hoken Sentā) : <නරුතෝ සෞඛ්‍ය සුභසාධන මධ්‍යස්ථානය(Narutō Hoken Fukushi Sentā> සහ < මත්සුඔITසෞඛ්‍ය සුභසාධන මධ්‍යස්ථානය > පිහිටා තිබෙනවා.

※ලියාපදිංචි වී සිටින අය ( Jūsho ga aruhito ) : වෙනත් නගරයක සිට මෙම නගරයේ පදිංචිය ඉල්ලුම් කළ බව ( සන්මුනගරයේ පදිංචිවීම ) නගරසභාවට දැනුම් දුන්පුද්ගලයා

# දරු උපතක් සිදුවූ විට ( දරුවා ඉපදී හැකි ඉක්මනින්ම )පහත සඳහන් දේ සිදුකළ යුතුය

## ( 1 ) කරුණාකර නගරසභාවට පැමිණෙන්න



දරු උප්පත්තියෙන් පසුව නගරසභාවට ගොස් පහත සඳහන් ආකාරයට ලියාපදිංචි කළයුතුය.

① බිළිදා හමුවීමේ සම්භන්ධතා පෝරමය ,<u>(අළුත උපන් බිළිදාගේ සෞඛ්‍ය තත්වය සොයා බැලීමසඳහා වින්නබු මාතාවට නිවසට පැමිණීම සඳහා ඉල්ලුම් කිරීමේ පෝරමය )</u> 「( දරුවාඉපදුන බව සඳහන් කරන ලියවිල්ල ) 「 ***Akachan Hōmon Renrakuhyō ( Shusshō Tsūchisho )*** 」」 මෙම පෝස්කාඩ් පත < සෞඛ්‍ය සේවා උපකාරක අංශය ( *Kenkō Shienka* )> ට භාරදිය යුතුයි. මාතෘ **සහ ළමා සෞඛ්‍ය** අත්පොත ( Boshi Kenkō Techō ) (ගර්භනී මවගේ සහ දරුවාගේ සෞඛ්‍ය තත්වයන් සටහන් කරන අත්පොතසමග ඔබට ලබාදී ඇති පෝස්කාඩ් පත)

② < ජාතික සෞඛ්‍ය රක්‍ෂණ සහ පැන්ෂන් අංශය ( *Kokuho Nenkinka* ) > වෙත ගොස් දරුවාව **ජාතික සෞඛ්‍ය රක්‍ෂණය** 「 ***Kokumin Kenkōhoken*** 」 ට ලියාපදිංචි කරවාගන්න.

( 24වෙනි පිටුව )

( 69 වෙනි පිටුව )

< ළමා සුභසාධන උපකාරක අංශය ( *Kosodate Shienka* ) > තුළදී <u>ළමා වෛද්‍ය සහනාධාර</u> 「 ***Kodomo Iryōhi Josei*** 」 **(වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා නගරසභාවෙන් ලබාදෙන සහනදායි සේවාව)** ඉල්ලුම් කරන්න.

( 69 වෙනි පිටුව)

- **දරු උප්පත්තියෙන් පසුව සෞඛ්‍ය නිළධාරිණිය ( *Hokenshi* ) දරුවා බැලීමට නිවසට පැමිණේ**

  දරුවෙක් ඉපදුන නිවසට වින්නඹු මාතාව ( *Josanshi* ) හෝ සෞඛ්‍ය නිළධාරිණිය ( *Hokenshi* ) දරුවා බැලීමට පැමිණෙනු ලැබේ.දරුවාගේ උස සහ බර මැනබලයි.
  අම්මා සහ දරුවා නිරෝගීව සිටිනවාදැයි පරික්ෂා කර බලයි.
  මුදල් වැයනොවේ.

◎ 64 පිටුවේ අමාරු වචන ◎
※වින්නඹු මාතාව ( *Josanshi* ) : ඉපදෙන බිළිදා පිළිබඳව සියළු විස්තර උපදෙස් ලබාගැනීමට හැකි නිළධාරිනිය
※සෞඛ්‍ය නිළධාරිණිය ( *Hokenshi* ) : ශරීර සෞඛ්‍ය පිළිබඳව උපදෙස් ලබාගත හැකි නිළධාරිනිය

— සටහන් —



| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම ) | ලිපිනය | දුරකථනඅංකය |
|---|---|---|
| සෞඛ්‍ය සේවා උපකාරක අංශය හපිනෙසු ( *Kenkō Shienka Hapinesu* ) **ගර්භ නීමච්චරුන් සහ ළදරුවන් සඳාහා** උපකාරක මද්‍යස්ථානය ( *Kosodate Sedai Hōkatsu Shien Sentā* ) | 296 බන්චි, තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) | 0475-80-1381 |

<සදුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා
※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.



## ළදරු සෞඛ්‍ය පරීක්ෂණයට ( සායනයට ) පැමිණෙන්න


කරුණාකර ඔබගේ දරුවා සෞඛ්‍ය පරීක්ෂණය ( අළුත උපන් බිළිදාගේ සෞඛ්‍ය සායනය ( Nyūyōji Kenkō Shinsa ) ට රැගෙන එන්න. මේ සඳහා මුදල් වැයනොවේ. දරුවාගේ සෞඛ්‍ය තත්වය පිළිබඳව කරුණාකර උපදෙස් ලබාගන්න

● පහත සඳහන් පිළිවෙලට කරුණාකර තෙවතාවක් සායන වලට සහභාගී වන්න.

| කවදා? | කොහේදිද | කුමක් කළයුතුද ? සිදුකරන සේවාවන් |
|---|---|---|
| **ළදරු වෛද්‍ය පරීක්ෂණය**<br>( *Nyūji Kenkō Shinsa* )<br><br>දරුවාඉපදී මාස 3 සිටමාස 4 ක් පසුවූ විට<br>පවත්වනු ලබන සායනය | සන්මු ඉරියෝ සෙන්තා<br>( *Sammu Iryō Sentā* ) | • වෛද්‍යවරයා ( *Ishi* ) දරුවාගේ ශරීර සෞඛ්‍ය තත්වය පිළිබඳව පරීක්ෂාකර බලයි.<br>• දරුවාගේ ශරීරයේ බර සහ උස ප්‍රමාණය පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• ඔබට නොදන්නා දෙයක් ඇත්නම් සෞඛ්‍ය නිලධාරීන්ගෙන් කරුණාකර උපදෙස් ලබාගන්න.<br>• පෝෂණ නිලධාරීන් ( *Eiyōshi* ) ගෙන් දරුවාගේ ආහාර ( *Shokuji* ) පිළිබඳව කරුණාකර උපදෙස් ලබාගන්න.<br>• දන්ත සහායක නිළධාරීන් ( *Shikaeiseishi* ) ගෙන් දරුවාගේ දත් පිළිබඳව උපදෙස් ලබාගන්න.<br>• මේ පිළිබද සඳහන් කර ඇති පිංතූර පොත් ලබාගත හැකිය. |
| අවුරුදු එකහමාරේ ළදරු සායනය<br>( *Issairokkagetsuji Kenkō Shinsa* )<br><br>දරුවා ඉපදී වයස අවුරුදු එකහමාරේ සිට අවුරුදු 2 ක දක්වා කාලය තුළදී පවත්වනු ලබන සායනය | සෞඛ්‍ය සේවා මද්‍යස්ථානය<br>( *Hoken Sentā* ) | • වෛද්‍යවරයා ( *Ishi* ) දරුවාගේ ශරීර සෞඛ්‍ය තත්වය පිළිබඳව පරීක්ෂාකර බලයි.( අවුරුදු එකහමාරේ දරුවන්ගේ ශරීර සෞඛ්‍ය සායන සඳහාපමණි )<br>• දන්ත වෛද්‍ය වරයා ( *Shikaishi* ) දරුවාගේ දත්වල සෞඛ්‍ය තත්වය පිළිබඳව පරීක්ෂාකර කරදෙනු ලැබේ.<br>• ශරීරයේ බර සහ උස ප්‍රමාණය පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• ඔබට නොදන්නා දෙයක් ඇත්නම් සෞඛ්‍ය නිලධාරීන්ගෙන් කරුණාකර උපදෙස් ලබාගන්න.<br>• පෝෂණ නිලධාරීන් ( *Eiyōshi* ) ගෙන් දරුවාගේ ආහාර ( *Shokuji* ) පිළිබඳව කරුණාකර උපදෙස් ලබාගන්න.<br>• දන්ත සහායක නිළධාරීන් ( *Shikaeiseishi* ) ගෙන් කරුණාකර දරුවාගේ දත් පිළිබඳව උපදෙස් ලබාගන්න. |
| අවුරුදු දෙකහමාරේ ළදරු වන් සඳහා වූ දන්ත සායනය<br>( *Nisairokkagetsuji Shika Kenkō Shinsa* )<br><br>දරුවා ඉපදී වයස අවුරුදු දෙක හමාරේ සිට අවුරුදු තුන ලබන කාලය තුළ දී පවත්වනු ලබන සායනය. | | |
| අවුරුදු 3 නේ ළදරු සායනය<br>( Sansaiji Kenkō Shinsa )<br><br>දරුවාට අවුරුදු 3 යි,මාස6සිට අවුරුදු 4 දක්වා | සෞඛ්‍ය සේවා මද්‍යස්ථානය<br>( *Hoken Sentā* ) | • වෛද්‍ය වරයා ( *Ishi* ) දරුවාගේ ශරීර සෞඛ්‍ය තත්වය පිළිබඳව පරීක්ෂාකර බලනුලැබේ.<br>• දන්ත වෛද්‍ය වරයා ( *Shikaishi* ) දරුවාගේ දත්වල සෞඛ්‍ය තත්වය පිළිබඳව පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• ශරීරයේ බර සහ උස ප්‍රමාණය පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• මුත්‍රා පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• ඇස් පෙනීම පිළිබඳව පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• කණ ඇසීම පිළිබඳව පරීක්ෂාකර දෙනු ලැබේ.<br>• මහජන සෞඛ්‍ය නිලධාරීන් සමග ඔබට නොදන්නා දෑ පිළිබඳව උපදෙස් ලබාගතහැක.<br>• පෝෂණ නිලධාරීන් ( *Eiyōshi* ) ගෙන් දරුවාගේ ආහාර ( *Shokuji* ) පිළිබඳව කරුණාකර උපදෙස් ලබාගන්න.<br>• දන්ත සහායක නිළධාරීන් ( *Shikaeiseishi* ) ගෙන් කරුණාකර දරුවාගේ දත් පිළිබඳව උපදෙස් ලබාගන්න. |

# දරුවන්ගේ එන්නත් < *Chūsha* > ලබාගන්න

දරුවා අසනීප නොවන ආකාරයට කරුණාකර එන්නත් < *Chūsha* > ලබාගන්න.
මුදල් වැයනොවේ.
විවිධ ආකාරයේ එන්නත් < *Chūsha* > වර්ගඇත.
දරුවන් සිටින අය රෝහලට යෑමට පෙර නගරසභාවේ <සෞඛ්‍ය සේවා උපකාරක අංශය ( *Kenkō Shienka* ) > වෙත ගොස් උපදෙස් ලබාගන්න.



< නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ >

① මාතෘ **සහ ළමා සෞඛ්‍ය** අත්පොත ( *Boshi Kenkō Techō* ) ගර්භනී මවගේ සහ දරුවාගේ සෞඛ්‍ය තත්වයන් සටහන් කරන අත්පොත

② මෛදක්ව ලබාගෙන ඇති එන්නත් පිළිබඳව සඳහන් කරඇති ලියවිල්ලක්

නගරසභාවේ < සෞඛ්‍ය සේවා උපකාරක අංශය ( *Kenkō Shienka* ) > වෙත ගොස් උපදෙස් ලබාගැනීමෙන්
නොමිළේ එන්නත්විදීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම් පත් ලබාගත හැක. දරුවා ඉපදුන අවස්ථාවේදීද මෙම ඉල්ලුම්පත් ලබගතහැකිය. මෙම එන්නත් විදීමේ ඉල්ලුම් පත රෝහලේදී භවිතා කරනු ලැබේ. ( මෙම කොලයට එන්නත් විදීමේ ඉල්ලුම් පත ( *Yoshinhyō* ) යැයි කියනුලබනවා. )

◎ 65 පිටුවේ සහ 66 වෙනිපිටුවේඅමාරු වචන ◎

※ළදරු වෛද්‍ය පරීක්ෂණය ( *Nyūyōji Kenkō Shinsa* ) : අළුත උපන් බිළිඳාගේ ශරීර සෞඛ්‍ය පරීක්ෂණය අළුත උපන් බිළිඳාගේ සෞඛ්‍ය තත්වය පිළිබඳව පරික්ෂා කිරීම රෝහලේ දී සහ නගරසභාවේ සෞඛ්‍ය උපකාරක සේවා මද්‍යස්ථානයයේ දී සිදු කරනු ලබනවා.මෙය වයස් මට්ටම් තුනකදී සිදු කෙරේ.දරුවා ඉපදී මාස තුනේදී සිදුකරන සායනය ( *Nyūji Kenkō Shinsa* ) අවුරුදු එකහමරේදී පවත්වන සායනය ( *Issairokka getsuji Kenkō Shinsa* ) සහ අවුරුදු තුනේදී පවත්වන සායනය ( *Sansaiji Kenkō Shinsa* ) වේ.

※වෛද්‍ය වරයා ( *Ishi* ) : රෝහලේ වැඩකරන වෛද්‍ය වරුන්. ලෙඩ සහ තුවාල හොඳකරදෙන වෛද්‍ය වරයා

※පෝෂණ නිලධාරීන් ( *Eiyōshi* ) : ආහාර පිළිබඳව සාකච්ඡා කළහැකි නිලධාරීන්

※දන්ත සහායක නිළධාරීන් ( *Shikaeiseishi* ) : දත් පිරිසිදුව තබාගැනීම පිළිබඳව උපදෙස් ලබාගතහැකි නිලධාරින්

※දන්ත වෛද්‍ය වරයා ( *Shikaishi* ) : නරක් වූ දත් නැවත සනීපකරදෙන වෛද්‍ය වරයා

※ආහාර ( *Shokuji* ) : කෑමට ගන්නා දේවල්

## ළමා එන්නත් වර්ග සහ එන්නත් ලබාගන්නා අවස්ථා

| බෙහෙත් විදින වයස් ප්‍රමාණය | එන්නත් වර්ගය ( හිරගනා වලින් ) | එන්නත් සංඛ්‍යාව |
|---|---|---|
| ඉපදී මාස 2කෙන් | රොතා ( *Rota* )<br>හිබ් ( HIB )<br>හයිඑන්ක්විකින් ( *Haienkyūkin* )<br>බි ගතා කන්එන් ( B *gatakan'en* ) | 1 වන වතාව<br>1 වන වතාව<br>1 වන වතාව<br>1 වන වතාව |
| ඉපදී මාස 3න් | රොතා ( *Rotha* )<br>හිබ් ( *HIB* )<br>හයිඑන්ක්විකින් ( *Haienkyūkin* )<br>බි ගතා කන්එන් ( *B gatakan'en* )<br>යොන්ෂුකොන්ගෝ ( *Yonshukongō* ) | 2 වන වතාව<br>2 වන වතාව<br>2 වන වතාව<br>2 වන වතාව<br>1 වන වතාව |
| ඉපදීමාස 4න් | රොතා ( රොතා තෙක්කු *Rotatekku* )<br>හිබ් ( *HIB* )<br>හයිඑන්ක්විකින් ( *Haienkyūkin* )<br>යොන්ෂුකොන්ගෝ ( *Yonshukongō* ) | 3 වන වතාව<br><br>3 වන වතාව<br>3 වන වතාව<br>2 වන වතාව |
| ඉපදී මාස 5න් | සීජී ( *BCG* )<br>යොන්ෂුකොන්ගෝ ( *Yonshukongō* ) | <br>3 වන වතාව |
| ඉපදී මාස 6සිට මාස11දක්වා | නිහොන්නෝඑන් (*Nihonnōen* )<br>බි ගතා කන්එන් ( *B gatakan'en* ) | 1 වන වතාව<br>2 වන වතාව<br>3 වන වතාව |
| වයස අවුරුද්දක් ගතවූ විට | එමආර්ඉක්කි ( MR *Ikki* )<br>සුයිතෝ ( *Suitō* )<br>හිබ් ( *HIB* )<br>හයිඑන්ක්විකින් ( *Haienkyūkin* ) | එම්.ආර්වල 1 වන වස්ථාව<br>1 වන වතාව<br>4 වන වතාව<br>4 වන වතාව |
| වයස අවුරුද්දයි මාස හයක් වූ විට1 | යොන්ෂුකොන්ගෝ ( *Yonshukongō* )<br>සුයිතෝ ( *Suitō* )<br>නිහොන්නෝඑන් ( *Nihonnōen* ) | 4 වන වතාව<br>2 වන වතාව<br>3 වන වතාව |
| ප්‍රාථමිකපාසල්ශිෂ්‍යයෙක්වීමට පෙර අවුරුද්ද | එම්ආර්නිකි ( *MR Niki* ) | එම්.ආර්වල 2 වන වතාව |
| අවුරුදු හතයිමාස හයක් වීමට පෙර | නිහොන්නෝඑන් ( *Nihonnōen* ), යොන්ෂුකොන්ගෝ ( *Yonshukongō* ) නම් එන්නත ලබාගෙන නොමැති දරුවන් සඳහා | |
| අවුරුදු නමයේ සිට අවුරුදු දොළහක් අතර | නිහොන්නෝඑන්නිකි ( *Nihonnōen niki* ) | නිහොන්නෝඑන්<br>4 වන වතාව |
| අවුරුදු එකොළහේ සිට අවුරුදු දොළහ අතර කාලය | නිෂූකොන්ගෝ ( *Nishukongō* ) | |
| අවුරුදු එකොළහේ සිට අවුරුදු පහළොව අතර කාලය | ගර්භාෂ පිළිකා එන්නත<br>( *Shikyūkeigan* ) | 3 වන වතාව |

* කරුණාකර රෝහලට දුරකතන ඇමතුමක් දී එන්නත් ලබාගැනීම සඳහා දිනයක් වෙන්කරවා ගන්න.
රෝහලට රැගෙන යායුතු දේ : මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොත ( *Boshi Kenkō Techō* )ගර්භනී මවගේ සහ දරුවාගේ සෞඛ්‍ය තත්වයන් සටහන් කරන අත්පොත,එන්නත් විදීමේ ඉල්ලුම්පත ( *Yoshinhyō* ) ( මුදල් වැය නොවී එන්නත් ලබාගන්නා ඉල්ලුම් පත් ) එන්නත් විදීම ප්‍රමාදවී ඇත්නම් හෝ නොදන්නා අවස්ථා වලදී නගරසභාවේ. < සෞඛ්‍ය ස්වා උපකාරකඅංශය ( *Kenkō Shienka* ) > වෙගොස් කරුණාකර උපදෙස් ලබාගන්න.

## — සටහන් —



| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම් ) | ලිපිනය | දුරකථනඅංකය |
|---|---|---|
| සෞඛ්‍ය සේවා උපකාරක අංශය<br>( *Kenkō Shienka* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය<br>( 296,Tonodai,Sammu-shi ) | 0475-80-1172 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ